**ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2025**

**------------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රේගුවේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් ඉක්මවා යාම වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනය පදනම් වී ඇත්තේ මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගත් විගණන සාක්ෂි මතය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01හි 02 වන ඡේදය ප්‍රකාරව, උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවද, මූල්‍ය අංශය වෙත ගෙවීම් සඳහා ඉදිරිපත් කරන ලද ත්‍යාග ගොනු මත පමණක් පදනම්ව අරමුදලේ ආදායම් හඳුනාගැනීම සිදුකර තිබුණි. විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2025 දෙසැම්බර් 31 දිනට හිඟ දණ්ඩන හා අහිමිකිරීම් ලෙස බාහිර පාර්ශවයන්ගෙන් ශ්‍රී ලංකා රේගුව වෙත ලැබිය යුතු රු.7,151,811,103ක සහ ශ්‍රී ලංකා රේගුවේ ගිණුම් අංශය වෙත දණ්ඩන හා අහිමි කිරීම් ලෙස ලැබී තිබුණද ත්‍යාග ගොනු සකස් කර නොතිබූ රු.2,064,153,420ක මුදලින් අරමුදලට හිමි සියයට 50ක මුදල වූ රු.4,607,982,261ක් උපචිත ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | මෙතෙක් අය නොවූ දඩ මුදල් ලෙස රු.7,628,755,553ක් හා දඩමුදල් ලෙස ලැබී තවදුරටත් ත්‍යාග ගොනු සකසා අවසන් නොකළ වටිනාකම ලෙස රු.2,064,153,420ක් වාර්තා වූ අතර එම මුදල්ද හෙළිදරව් කිරීමක් ලෙස සටහන් මඟින් දක්වා ඇත. දණ්ඩන ලෙස ලැබෙන මුදල් රේගුවේ පොදු තැන්පත් ගිණුමට බැර කරන අතර ත්‍යාග අරමුදලට ලැබිය යුතු සියයට 50% වටිනාකම ත්‍යාග ගොනුව ගෙවන අවස්ථාවේ දී අරමුදලට බැර කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව, අරමුදලට ලැබිය යුතු ආදායම් උපචිත පදනම මත නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල සකස් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ත්‍යාග අරමුදලේ උප අරමුදල් ලෙස පවත්වාගෙන යනු ලබන අනෙකුත් සංචිත සහ මත්ද්‍රව්‍ය නිවාරණ උප අරමුදල් මඟින් සමාලෝචිත වර්ෂය තුළ දරන ලද පිළිවෙළින් රු.705,942,036ක් සහ රු.14,800,000ක් වූ වියදම්, ත්‍යාග අරමුදලේ වියදම් ලෙස සලකා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | ඉන්ධන, මත්ද්‍රව්‍ය නිවාරණ, 2.5% ත්‍යාග හා අනෙකුත් සංචිත ත්‍යාග අරමුදලේම උප අරමුදල්වන බැවින් හා එම උප අරමුදල් සඳහා වෙන වෙනම මූල්‍ය ප්‍රකාශන සකස් නොකරන බැවින් එම උප අරමුදල්වලින් දරන ලද වියදම් ත්‍යාග අරමුදලේම වියදම් බැවින් උප අරමුදල්වලින් දරන ලද සියළු වියදම් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ වියදම් ලෙස දක්වා ඇත. | ත්‍යාග අරමුදලේ වියදම් නිවැරදිව හඳුනාගෙන, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ පැහැදිලිව හා නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1869 අංක 17 දරන රේගු ආඥා පනතේ 153(2)(ආ) වගන්තිය. | තෑග අරමුදලින් තෑග මුදල් බෙදා හැරීම මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු යෝජනා ක්‍රමයකට අනුව කළ යුතු වුවද, 1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට තහවුරු කර ගැනීමකින් තොරව තෑග මුදල් ගෙවා තිබුණි. ඒ අනුව, 2012 සිට 2025 වර්ෂය දක්වා වූ වර්ෂ 14ක කාලය තුළ නිලධාරීන් සඳහා රු.31,841,796,739 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.5,421,015,509ක් ද තෑග මුදල් ලෙස බෙදාහැර තිබුණි. එසේම, විමර්ශන කාර්යයන්ට සෘජුව දායක නොවන දෙපාර්තමේන්තුවේ අනිකුත් නිලධාරින් වෙතද අරමුදලින් ගෙවීම් සිදුකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දී අනෙකුත් අංශ 18ක නිලධාරීන් සඳහා එසේ වෙන්කළ තෑග මුදල රු.647,911,453ක් විය. | සෑම වර්ෂයකම තෑග අරමුදලින් තෑග මුදල් බෙදා හැරීම සඳහා වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර මුදල් අමාත්‍යවරයාගේ පෞද්ගලික අනුමැතිය ලබා ගෙන මේ දක්වා මුදල් ගෙවා ඇත. තවද රේගු දෙපාර්තමේන්තුවේ කාර්යයසාධනය සියලු අංශවල නිලධාරීන්ගේ ඒකාබද්ධ දායකත්වය මත සිදු වන බැවින් රේගු අංශවල නිලධාරීන්ගේ අභිප්‍රේරණය හා කාර්යයසාධනය උදෙසා රේගු වැටලීම් හා දායක වන සියලු අංශවල නිලධාරීන් නියෝජනය වන පරිදි තෑග මුදල් බෙදා හැරීමට කටයුතු කර ඇති බව සඳහන් කරමි. | රේගු ආඥා පනතේ විධිවිධාන හා අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යෝජනා ක්‍රමයට අනුකූලව තෑග මුදල් බෙදාහැරීමට කටයුතු කළ යුතුය. |

**2. මෙහෙයුම් සමාලෝචනය**

**2.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩ ආනයන අපනයන ක්‍රියාවලිය හා සම්බන්ධිත පාර්ශවයන් විසින් සිදු කරන විවිධ අක්‍රමිකතාවන් සම්බන්ධයෙන් 2021 වර්ෂයට පෙර සිට සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වා කාල පරිච්ඡේදය තුල ශ්‍රී ලංකා රේගුවේ අංශ 16ක් යටතේ සිදු කර | අදාළ හිඟ දණ්ඩන මුදල් සහ අභිහි කිරීම් වටිනාකම් අය කර ගැනීම සඳහා අවශ්‍ය පසුවිපරම් ලෙස අදාළ ආයතන හා පුද්ගලයන්හට සිහිකැඳවීම් යොමු කිරීම, නීතිපති | දීර්ඝ කාලයක් හිඟව පවතින මෙම දණ්ඩන හා අභිහි කිරීම් කඩිනමින් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් හා විධිමත් පසුවිපරම් ක්‍රමවේදයක් |

| | | | |
|---|---|---|---|
| | තිබූ රේගු විමර්ශන 252කට අදාළව රේගු ආඥා පනතේ වගන්ති ප්‍රකාරව දණ්ඩන හා අහිමි කිරීම් ලෙස පනවා තිබූ රු.7,151,811,103ක් තවදුරටත් අයවීමට පැවති බව නිරීක්ෂණය විය. | දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගැනීම, අධිකරණයේ නඩු පැවරීම යන කටයුතු සිදුකරයි. E-CCR පද්ධතිය නවීකරණය කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇත. | ක්‍රියාත්මක කිරීමටත්, මධ්‍යම රේගු විමර්ශන ලියාපදිංචි කිරීම සඳහා භාවිත කරන පරිගණක පද්ධතිය මඟින් හිඟ දණ්ඩන හා අහිමි කිරීම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබාගැනීමට හැකි අයුරින් පරිගණක පද්ධතිය සංවර්ධනය කිරීමටත් අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | භාණ්ඩ ආනයන හා අපනයන ක්‍රියාවලිය හා සම්බන්ධ පාර්ශ්වයන් විසින් සිදුකරන ලද විවිධ අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණනයේදී අනාවරණය වූ පරිදි, 2022 සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ රේගු පරීක්ෂණ 65කට අදාළව පැහැර හැර තිබූ රු.2,097,525,949ක බදු ආදායම වෙනුවෙන් එම පරීක්ෂණ අවසානයේ නියම කර තිබූ එකතුව රු.46,970,621,345ක් වූ දණ්ඩන මුදලින් සියයට 95කට වැඩි ප්‍රමාණයක් එනම් රු.44,637,800,387ක් ලිහිල් කර, රු.2,332,820,958ක් පමණක් අයකරගෙන තිබුණි. එම අයකරගත් මුදලින් සියයට 30ක් වූ රු.699,846,287ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබීම හේතුවෙන් ( ඉතිරි සියයට 70 ක වටිනාකම නිලධාරීන්ට ත්‍යාග ගෙවීම සඳහා වූ ත්‍යාග අරමුදලට හා රේගු නිලධාරීන්ගේ කළමනාකරණ හා වන්දි අරමුදලට බැර වේ.) ඉහත පරිදි පැහැර හැර තිබූ රු.2,097,525,949ක බදු ආදායම හා සැසඳීමේදී රු.1,397,679,662ක රාජ්‍ය ආදායම අහිමි වීමක් සිදුව තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, දණ්ඩන පැනවීමෙන් රජයට ලැබුණු ආදායම, පැහැර හැර තිබූ බදු ආදායමවත් ආවරණය කිරීමට ප්‍රමාණවත් නොවන අවස්ථා පැවති බැවින්, රේගු ආඥා පනතේ 166(ආ)(ආ) වගන්තිය කෙරෙහි අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවය නිරීක්ෂණය විය. | රේගු පරීක්ෂණයක් අවසානයේ රැස් කර ගනු ලබන ආදායමින් ප්‍රථමව පැහැර හැර තිබූ බදු හා ගාස්තු වටිනාකම රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බව රේගු ආඥා පනතේ හෝ වෙනත් ව්‍යවස්ථාපිත නීතියක හෝ සඳහන් නොවන බව නිරීක්ෂණය කරමි. තුන් ගුණයක වටිනාකමට සමාන මුදලක් දණ්ඩනයක් ලෙස පැවරීමට හැකි වුවත්, සිදු කළ වරදට ගැලපෙන දඩයක් නියම කිරීමේ අභිමතානුසාරී බලය රේගු පරීක්ෂණ නිලධාරියා වෙත තිබීම අවශ්‍ය කරුණකි.<br>කෙසේවෙතත්, නැවත එම වරද නොකිරීමට සරිලන දඩ නියම කිරීම සඳහා අංක 1697 හා 2025.08.27 දිනැති දෙපාර්තමේන්තු නියෝගය දැනටමත් නිකුත් කර ඇත.<br>අවස්ථානුකූලව රේගු ආඥා පනතේ 166 වගන්තිය කෙරෙහි අවධානය යොමු කරමින් 163 වගන්තිය යටතේ දණ්ඩන ලිහිල් කිරීමට කටයුතු කර ඇත. | රේගු ආඥා පනතේ 166(ආ)(ආ) වගන්තිය කෙරෙහි අවධානය යොමු කරමින් රජයට අය විය යුතු ආදායම් නිසි පරිදි අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රේගු වංචා හෝ වැරදි සම්බන්ධයෙන් රේගු නිලධාරින් විසින් අනාවරණය කරගත් කරුණු මත හෝ ඔත්තුකරුවන් විසින් ලබා දෙන ලද තොරතුරු මත රේගු පරීක්ෂණ ආරම්භ කරනු ලබන අතර, 2015 ජුලි 01 සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රේගුවේ විවිධ අංශ විසින් රේගු පරීක්ෂණ 42,086ක් ලියාපදිංචි කර තිබුණි. කෙසේ වෙතත්, එම පරීක්ෂණ අතරින් 9,307ක් එනම් සියයට 22ක් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබූ අතර, එම නොවිසඳී පැවති පරීක්ෂණවලින් 4,892ක් එනම් සියයට 52.5ක් වසර 05කට වැඩි කාලයක්ද, 3,207ක් එනම් සියයට 34ක් වසර 01කට වැඩි නමුත් වසර 05කට අඩු කාලයක්ද නොවිසඳී පැවති බව නිරීක්ෂණය විය. මෙලෙස රේගු විමර්ශන ගොනු අවසන් කිරීම වසර ගණනාවක් ප්‍රමාද වීම හේතුවෙන් රජයට ලැබිය යුතු ආදායම් අයකර ගැනීම ප්‍රමාද වීම, අත්අඩංගුවට ගත් භාණ්ඩ නශ්‍ය වීම හෝ පසුව අලෙවි කිරීමේදී ඒවායේ නියම වටිනාකම ලබාගැනීමට නොහැකි වීම සහ ඔත්තුකරුවන් හා නිලධාරීන් අධෛර්යයට පත්වීම වැනි අවාසිදායක තත්ත්වයන් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය. | විමර්ශන විසඳීම කල් ගතවීමට විවිධ හේතු පවතී. රේගු වරදක් සිදුවී ඇති/නැති බව තහවුරු කිරීම සඳහා ලේඛන සොයා ගැනීමට, රේගුව වෙත ලද තොරතුරු විශ්ලේෂණයට සහ ඒ අනුව නැවත නැවතත් කරුණු අනාවරණය කිරීමට, සැකකාර පාර්ශව/ආයතන රේගුව වෙත අදාළ පරිදි ප්‍රතිචාර දැක්වීමට, සැකකාර පාර්ශව රේගුව වෙත ප්‍රතිචාර නොදක්වන විට ඔවුන් නීතිය හමුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට, රසායනාගාර, තක්සේරු වාර්තා ආදිය ලබා ගැනීමට, අනෙකුත් නියාමන ආයතන මගින් පනවන ලද කොන්දේසි සම්පූර්ණ කිරීමට, භාණ්ඩ නැවත අපනයනය කිරීමට නියෝග කර ඇති විට ඒවා අපනයනය කිරීමට, රාජසන්තක කළ භාණ්ඩ අපහරණ ක්‍රියාවලියට, අභියාචනා සලකා බැලීමට යම් කාලයක් ගත වීම යනාදිය හේතුවෙන් විමර්ශන විසඳීමට කල්ගත වේ. රේගු විමර්ශනයට/ තීන්දුවට එරෙහිව නඩු පවරා ඇති විට නඩු තීන්දුව ලැබෙන තෙක් රේගු විමර්ශන ගොනුව අවසන් නොකෙරේ. කෙසේවුවද, රේගු විමර්ශන අවසානයෙහිදී රේගු පරීක්ෂණය පැවැත්වීම සඳහා දින නියම කල පසු මාස 3ක් ඇතුලත එම පරීක්ෂණ නිම කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් දෙපාර්තමේන්තු නියෝගයක් නිකුත් කිරීමට කටයුතු කරමින් පවතී. | දීර්ඝ කාලයක් තිස්සේ නොවිසඳී පවතින රේගු විමර්ශන හඳුනාගෙන ප්‍රමුඛතාවය මත කඩිනමින් අවසන් කිරීමටත්, විමර්ශන අවසන් කිරීම සඳහා නිශ්චිත කාලසීමා හා ඵලදායී පසුවිපරම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

## 2.3. අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම අරමුණු කරගෙන ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වශයෙන් ඉන්ධන අරමුදල පිහිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද ත්‍යාග අරමුදලින් රු.253,489,233ක් එම අරමුදලට බැර කර තිබුණි. කෙසේ වෙතත්, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂයෙන් දරා තිබීම හේතුවෙන්, 2019 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා කාලය තුළ 2023 වර්ෂයේ දරන ලද රු.554,500ක වියදම හැර ඉන්ධන අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව, අරමුදල පිහිටුවීමේ අරමුණ සඳහා එහි මුදල් ප්‍රමාණවත් ලෙස උපයෝජනය නොකිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය අවසානය වන විට අරමුදලේ සමුච්චිත ශේෂය රු.1,454,447,773ක් දක්වා වර්ධනය වී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. රේගු නිවාරණ කටයුතු සඳහා යම් අතිරික්ත ඉන්ධන අවශ්‍යතාවයක් ඇතිවුවහොත් ඒ සඳහා යොදා ගැනීමටත්, LTTE යුදමය තත්ත්වය පැවති කාලය තුල රේගු දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ රේගු නිවාරණ කටයුතු සඳහා යොදා ගන්නා ලද නාවික අංශයෙහි ඉන්ධන අවශ්‍යතාවය සපුරා ගැනීම මෙම අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ වුවද රේගු නිවාරණ කටයුතු සඳහා අතිරික්ත ඉන්ධන අවශ්‍යතාවයන් ඇති නොවීම මත මෙම අරමුදලේ ශේෂය සමුච්චිත වී ඇත. ඒ අනුව ඉදිරියේදී හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු සැකසීමට සටහන් කර ගතිමි. | අරමුදලේ අරමුණු සම්බන්ධයෙන් යළි සමාලෝචනයක් සිදු කර වර්තමාන අවශ්‍යතාවයන් අනුව නව අරමුණු හඳුනාගෙන ඒ අනුව අරමුදල් පරිහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | යම්කිසි විමර්ශනයකට අදාළව දඩ හෝ විකුණුම් ලෙසින් මුදල් ලැබී නොමැති අවස්ථාවල එම විමර්ශන සඳහා සහභාගී වූ නිලධාරීන්ගේ කැපවීම හා සේවය ඇගයීම උදෙසා යම් ත්‍යාගයක් පිරිනැමීම අවශ්‍ය යැයි රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් කරන්නේ නම් එවැනි අවස්ථාවල යොදා ගැනීම සඳහා ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වශයෙන් පිහිටුවා ඇති සියයට 2.5ක අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේ දී රු.127,020,846ක් බැරකර තිබුණ ද, වර්ෂය තුලදී අරමුදලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලේ සමුච්චිත ශේෂය රු.614,780,890ක් දක්වා වර්ධනය වී තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඒ අනුව ඉදිරියේදී හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු සැකසීමට සටහන් කර ගතිමි. | අරමුදලේ අපේක්ෂිත අවශ්‍යතාවය නිවැරදිව පුරෝකථනය කර තාත්වික ඇස්තමේන්තු සකස් කිරීමෙන් අනතුරුව ඒ අනුව උප අරමුදල් සඳහා මුදල් වෙන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති ඉන්ධන අරමුදල, මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල, 2.5% අරමුදල සහ අනෙකුත් | රේගු ආඥා පනතේ 153 (2)(ආ)අනුව ත්‍යාග මුදල් ගෙවීම සඳහා ගොනු ඉදිරිපත් | උප අරමුදල්වල වර්තමාන හා අනාගත අවශ්‍යතාවය යළි සමාලෝචනය කර, |

| | | |
|---|---|---|
| සංචිත අරමුදල යන උප අරමුදල්වල පැවති සමුච්චිත ශේෂය රු.2,707,387,539ක් වූ අතර, ඉන් රු.1,080,651,409ක් හෙවත් සියයට 40ක ප්‍රමාණයක් වසර 05කට වැඩි කාලයක් එනම් 2020 වර්ෂය හා ඊට පෙර සිටද, රු.1,232,644,556ක් හෙවත් සියයට 45ක් වසර 1ත් 5ත් අතර කාලයක්ද භාවිතයට නොගෙන පැවති ශේෂයන් විය. ඒ අනුව, උප අරමුදල්වල සමුච්චිත ශේෂයන්හි කාල විශ්ලේෂණය අනුව, සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් දීර්ඝ කාලයක් සිට පරිහරණය නොකර සමුච්චිතව පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය. | කිරීමේදී අදාල අරමුදල් සඳහා ත්‍යාග ගොනුවේ මුළු මුදලින් යම් ප්‍රතිශතයක් වෙන් කරනු ලබන අතර එම මුදල් මෙම අරමුදල් සඳහා බැර කර ගෙවීම් සිදුකරනු ලබන්නේ අදාල ඉල්ලීම් පදනම් කරගෙන වේ. එසේ ඉල්ලීමක් ලැබෙන තෙක් එම අරමුදල් ශේෂය සමුච්චිතව පවතී. | දිගුකාලීනව පරිහරණය නොකර පවතින අරමුදල් ශේෂයන් ඵලදායීව පරිහරණය කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් සැකසීම පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |

## 3. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 3.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිසි පුරෝකථන හා අයවැයගත දත්ත මත පදනම් නොවී අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන්, රෛගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව ඉන්ධන අරමුදලින් හා 2.5% ත්‍යාග අරමුදලින් වියදම් දැරීමට පිළිවෙලින් රු.50,000,0000ක් හා රු.250,000,000ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ මෙම අරමුදල්වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි. ඒ අනුව, අයවැය ඇස්තමේන්තු තාත්වික පුරෝකථන මත සකස් කර නොතිබූ බව නිරීක්ෂණය විය. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඒ අනුව ඉදිරියේදී හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික ඇස්තමේන්තු සැකසීමට සටහන් කර ගනිමි. | නිවැරදි හා තාත්වික පුරෝකථන මත අයවැය ඇස්තමේන්තු සකස් කර, අයවැය ප්‍රතිපාදන ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |